සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය 2022 (2023) **1160**

**Third Term Test**

6 ශ්‍රේණිය | විද්‍යාව | කාලය : පැය 2 යි

නම : ..................................................................................................................................................................

### I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ජීවින් තුළ ශක්තිය නිපදවන ක්‍රියාවලිය,
    (1) පෝෂණය යි.
    (2) ප්‍රජනනය යි.
    (3) ශ්වසනය යි.
    (4) වර්ධනය යි.


02. ශාක හා සතුන් අතර ප්‍රධාන වෙනසක්මක් වන්නේ,
    (1) ප්‍රභාසංශ්ලේෂණය යි.
    (2) ශ්වසනය යි.
    (3) වර්ධනය යි .
    (4) චලනය යි.

03. වායු පදාර්ථයට පමණක් පොදු වූ ලක්ෂණයක් වන්නේ,
    (1) නිශ්චිත හැඩයක් තිබීම යි.
    (2) අවකාශයේ ඉඩක් නොගැනීම යි.
    (3) නිශ්චිත පරිමාවක් තිබීම යි.
    (4) නිශ්චිත පරිමාවක් නොතිබීම යි.

04. ඝන, ද්‍රව හා වායු පදාර්ථයට උදාහරණ පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
    (1) අයිස්, ජලවාෂ්ප, වායු
    (2) අයිස්, ජලය, ජලවාෂ්ප
    (3) ගඩොල, ඉටිවාෂ්ප, ජලවාෂ්ප
    (4) ජලය, පොල්තෙල්, ඔක්සිජන්

05. මේවා අතුරින් පොසිල ඉන්ධනයක් නොවන්නේ කුමක් ද?
    (1) ද්‍රව පෙට්‍රෝලියම් වායුව
    (3) පොල්කටු අඟුරු
    (2) ගල් අඟුරු
    (4) ෂෙට්‍රල්

06. වායු පදාර්ථයේ ලක්ෂණයක් හඳුනා ගැනීමට සුදානම් කළ ඇටවුමේ A බැලුනයේ වාතය ඉවත් කළ විට,
    (1) A බැලුනය ඉහළ යයි, B බැලුනය පහළ යයි.
    (2) A බැලුනය පහළ යයි, B බැලුනය ඉහළ යයි.
    (3) A හා B බැලුන වෙනසක් නොවේ.
    (4) මීටර් කෝදුව සමතුලිතව පවතී.




LIVEWORKSHEETS

07. ද්‍රව පරිමාව මැනීම සඳහා විද්‍යාගාරයේ භාවිත වන උපකරණය,

(1) පරීක්ෂා නලය වේ. (2) බීකරය වේ.

(3) මිනුම් සරාව වේ. (4) කැකැරුම් නලය වේ.

08. විද්‍යුත් ප්‍රභව පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) ඩයිනමෝව, විදුලි බුබුල, සූර්යකෝෂය (2) ඩයිනමෝව, සූර්යකෝෂ, වියළිකෝෂය

(3) වියළිකෝෂය, විදුලි පන්දම, බල්බය (4) විදුලිපන්දම, බල්බය, ඩයිනමෝව

09. විදුලි බලාගාරය හා එය පිහිටි ස්ථානය නිවැරදිව දක්වා **නොමැති** පිළිතුර කුමක් ද?

(1) ගල්අඟුරු බලාගාරය - නොරොච්චෝලේ (2) ජලවිදුලි බලාගාරය - වික්ටෝරියා

(3) සුළං බලාගාරය - හම්බන්තොට (5) ඩීසල් බලාගාරය - ලක්ෂපාන

10. පාරදෘශ්‍ය, පාරභාසක හා පාරාන්ධ ද්‍රව්‍ය පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,


(1) තුනී වීදුරු, මල්වීදුරු, කාඩ්බෝඩ්. (2) කළු කඩදාසි, මල්වීදුරු, වාතය.

(3) මල්වීදුරු, වාතය, කළු කඩදාසි. (4) වාතය, තෙල් කඩදාසි, තුනී වීදුරු.

11. පහත සඳහන් පරිපථය තුළින් විදුලිය ගමන් කරන විට ඉටි බිංදු ද්‍රව බවට පත්වේ. මෙහි දී සිදුවන්නේ, විද්‍යුතයෙන්,

(1) තාපය නිපදවීම යි. (2) ආලෝකය නිපදවීම යි.

(3) චුම්බක බලය නිපදවීම යි. (4) මේ කිසිවක් නොවේ.




12. ප්‍රකාශ තන්තු තාක්ෂණය භාවිත **නොවන** අවස්ථාව කුමක් ද?

(1) උසස් තත්ත්වයේ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සම්බන්ධ කිරීම.

(3) දුරකථන සම්බන්ධතා ජාලවල.

(2) කුඩා වස්තු විශාලකර බැලීම.

(4) ශරීර අභ්‍යන්තරය පරීක්ෂා කිරීම.

13. වර්තමාන ශ්‍රී ලංකාවේ භාවිතයට නොගන්නා ශක්ති ප්‍රභවය,

(1) සුළඟ වේ. (2) පොසිල ඉන්ධන වේ.

(3) ජෛව ස්කන්ධ වේ. (4) මුහුදු රළ වේ.

14. a, b, c යන ද්‍රව්‍ය තුනක් දණ්ඩ චුම්බකයක ධ්‍රැව අසලට ළං කළ විට ඇතිවන නිරීක්ෂණ පහත වගුවේ දැක්වේ.

| ද්‍රව්‍යය | N ධ්‍රැවය ළං කල විට | S ධ්‍රැවය ළං කල විට |
|---|---|---|
| a | ආකර්ෂණය වේ | ආකර්ෂණය වේ. |
| b | ආකර්ෂණය හෝ විකර්ෂණය නොවේ. | ආකර්ෂණය හෝ විකර්ෂණය නොවේ. |
| C | ආකර්ෂණය වේ. | විකර්ෂණය වේ. |

ඉහත නිරීක්ෂණ අනුව a, b, c ද්‍රව්‍ය පිළිවෙලින්,

(1) චුම්බකය, කාබන් හා මිනිරන් වේ. (2) කාබන්, යකඩ හා චුම්බක වේ.

(3) යකඩ , කාබන් හා චුම්බක වේ. (4) යකඩ , චුම්බක හා කාබන් වේ.



LIVEWORKSHEETS

15. ද්‍රව අවස්ථාවේ පවතින ලෝහය,

(1) රසදිය වේ.
(3) රිදී වේ.
(3) තඹ වේ.
(4) රත්රන් වේ.

16. කම්බි දඟරයක් තුළ චුම්බකයක් චලනය කරන විට විදුලි ධාරාවක් නිපදවෙන බව පළමුවරට නිරීක්ෂණය කළ විද්‍යාඥයාගේ නම නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

(1) ඩී.ජේ. විමලසුරේන්ද්‍ර
(2) මයිකල් ෆැරඩේ
(3) ඇලෙක්සැන්ඩ්‍රා වෝල්ටා
(4) බෙන්ජමින් ෆ්රෑන්ක්ලින්

17. පරිසර උෂ්ණත්වය අනුව දේහ උෂ්ණත්වය වෙනස් නොවන සත්ත්ව කාණ්ඩය වන්නේ,

(1) උරගයින් ය.
(3) මත්ස්‍යයින් ය.
(2) උභයජීවීන් ය.
(4) ක්ෂීරපායින් ය.

18. පරිසරයේ සමතුලිත බව ආරක්ෂා කරගැනීමට වැදගත් වන ජීවි කාණ්ඩය,

(1) නිෂ්පාදකයින් වේ.
(2) ශාක භක්ෂකයින් වේ.
(3) මාංශ භක්ෂකයින් වේ.
(4) ඉහත සියල්ලම වේ.

19. චීනයේ ජීවත්වන පැන්ඩා වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති සත්ත්වයෙකි. එයට ප්‍රධාන හේතුව,

(1) ශාක භක්ෂක සත්ත්වයෙකු වීමයි.
(3) ශීත දේශගුණයට ඔරොත්තු නොදීමයි.
(3) උණ ශාකය මත පමණක් යැපීමයි.
(4) ඉහත කිසිවක් නොවේ.

20. ශක්ති ප්‍රභවවල තිරසර භාවිතය සඳහා ගතහැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) විකල්ප ශක්ති ප්‍රභව භාවිතයට යොමු වීම.
(2) සූත්‍රිකා බල්බ වෙනුවට LED පහන් භාවිතය.
(3) ඇඳුම් කිහිපයක් එකවර මැද ගැනීම.
(4) ඉහත සියල්ල ම.



LIVEWORKSHEETS